NCP/PSC/3/2/Exam(vවෙළුම) 2025.02.

**අභ්‍යන්තර විභාග නිවේදනය :- 06/2025**

ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් කාර්යාලය , උතුරු මැද පළාත.
අභ්‍යන්තර විගණක, පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව, උතුරු මැද පළාත.

**උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය හා ඒ යටතේ ඇති ආයතන වල සේවය කරනු ලබන නිලධාරීන් හා සේවකයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ - 2025 (1)**

උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2025 වර්ෂයේ පළමු අර්ධ වාර්ෂිකය තුළ දී පැවැත්වීමට නියමිත **උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ හා ඒ යටතේ ඇති පහත සඳහන් ආයතන වෙනුවෙන් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම සඳහා** මෙයින් නිවේදනය කරනු ලැබේ.

- **ප්‍රධාන ලේකම් කාර්යාලය (ඇමුණුම - 01)**
- **පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව (ඇමුණුම - 02)**

**01. ඉල්ලුම් පත්‍ර යොමු කිරීම :-**

මෙම නිවේදනය පරිදි එක් එක් තනතුරට අදාළ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටි අනුව නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සඳහා පෙනී සිටීමට සුදුසුකම් සපුරා ඇති **උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය හා පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධාරීන් / සේවකයන්** මේ සමඟ අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රය ප්‍රකාර තමන් විසින් සකස් කර ගත් අයදුම්පත්‍ර **2024.03.15 වෙනි දින හෝ ඊට පෙර** තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින්, **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු මැද පළාත"** වෙත එවිය යුතු බව දන්වමි.

සැ.යු. – **1. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් සහ නියමිත දිනට නොලැබෙන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අදාළ ශ්‍රේණියට පත්වූ / උසස් වූ ලිපියේ ඡායා පිටපතක් අනිවාර්යයෙන්ම අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය. එසේ නොමැති අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.)**

**2. අනුමත බඳවා ගැනීමේ පරිපාටිවල සඳහන් සුදුසුකම්, විෂයය නිර්දේශයන් හා අදාළ විභාග ගාස්තු ගෙවීම් පිළිබඳ කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම අනිවාර්යය වේ.**

**02. විභාග ගාස්තු :-**

අයදුම්පත්‍රය නිවැරදිව හා පැහැදිලිව සම්පූර්ණ කළ යුතුය. පළමුවරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් කිසිඳු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතකුදු වුවත් ඉන්පසු වාර වලදී නිලධාරීන් විසින් එකවර සම්පූර්ණ විභාගයට පෙනී සිටින්නේ නම්, රු.480/- ක් ද, විෂයයන් දෙකක් සඳහා රු.360/- ක් ද,එක් විෂයයක් සඳහා රු.240/- ක් ද විභාග ගාස්තු වශයෙන් උතුරු මැද පළාත් සභාවේ අංක : **2003.02.13** අය ශීර්ෂයට බැරවන පරිදි උතුරු මැද පළාතේ ඕනෑම දිස්ත්‍රික් ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා ලබා ගන්නා ලද ලදුපතේ **(එන්සී100) මුල් පිටපත** අයදුම්පත්‍රයේ ඇලවිය යුතුය. **(තැපැල් කාර්යාලයට මුදල් ගෙවා ලබා ගන්නා කුවිතාන්සි හෝ රජයේ ආදායමට මුදල් බැර කරනු ලබන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. ගෙවන ලද විභාග ගාස්තු කිසිම හේතුවක් මත ආපසු නොගෙවන බවත්, වෙනත් කිසිම විභාගයක් සඳහා මාරු කිරීමට ඉඩ නොදෙන බවත් සැලකිය යුතුය.)**

**<u>03. විභාග ප්‍රවේශ පත්‍ර හා විභාගය පැවැත්වීමේ කොන්දේසි :-</u>**

අපේක්ෂකයන් තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යය හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ කිසියම් එක් මාධ්‍යයකින් පමණක් පිළිතුරු සැපයිය යුතුය. අයදුම්පතේ සඳහන් භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

**<u>04. අයදුම්පත්‍ර ඉදිරිපත් කර පරීක්ෂණ වලට පෙනී නොසිටීම :-</u>**

විභාගය සඳහා අයදුම්කර නොවැළැක්විය හැකි හේතුවක් මත විභාගයට පෙනී සිටීමට නොහැකිවන්නේ නම්, **තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් හැකිතාක් කල්වේලා ඇතිව උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව දැනුවත් කළ යුතුය.** (අදාළ විභාග ප්‍රවේශ පත්‍රය නැවත එවිය යුතුය)

එසේ නොමැතිව **<u>හදිසි අසනීප තත්ත්වයක්</u>** මත පරීක්ෂණ සඳහා පෙනී සිටීමට නොහැකිවුවහොත් ඒ බව **වෛද්‍ය සහතිකයකින්** ද, <u>රෝහල් ගතවී නේවාසික ප්‍රතිකාර ලැබූවේ</u> නම් ඒ බව **දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරී සහතිකයකින් ද සනාථ කළ යුතුය.**

ඉහත පරිදි කල්වේලා ඇතිව හා ප්‍රමාණවත් ලෙස හේතු දැක්වීමක් නොකර විභාගයට පෙනී නොසිටින අයදුම්කරුවන් සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කරනු ලැබේ.

I. පෙනී නොසිටි විභාග අවස්ථාව ඔහුට / ඇයට නියමිත විභාග අවස්ථාවක් ලෙස ගණනය කිරීම.

II. අදාළ විභාග සඳහා දරන ලද පිරිවැයට සාපේක්ෂව අදාළ අයදුම්කරු / අයදුම්කාරියගෙන් ඒකක පිරිවැය අගයක් අයකර ගැනීම.

**05.** ඉහත උපදෙස් හොඳින් කියවා තේරුම් ගෙන ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කරන ලෙසත්, උපදෙස් වලින් බැහැරව ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමෙන් වළකින ලෙසත්, අදාළ නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත් දන්වන අතර, **ඔබ විසින් <u>ඉල්ලුම්පත් නිර්දේශ කිරීමේදී ඒ පිළිබඳ විශේෂ අවධානයක් යොමු කිරීමට කටයුතු කරන ලෙස ද දන්වමි.</u>**

- **නියමිත ඇමුණුම් සහ ආදර්ශ අයදුම්පත උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියෙන් ([www.psc.nc.gov.lk](http://www.psc.nc.gov.lk) ) භාගත කරගන්නා ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.**

අ/කළේ,

එන්.එස්.හෙට්ටිආරච්චි,
සහකාර ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු මැද පළාත

ජී.කේ.එස්.චන්ද්‍රලතා,
ලේකම්,

ඇමුණුම - 01

## ප්‍රධාන ලේකම් කාර්යාලයේ සේවය කරනු ලබන නිලධාරීන් හා සේවකයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ - 2025 (1)

| අනු අංකය | වැටුප් කේතය | තනතුර | ශ්‍රේණිය | පරීක්ෂණය |
|---|---|---|---|---|
| 01 | SL - 1 | විධායක සේවා ගණයේ නීති නිලධාරී | | |
| | | III ශ්‍රේණියට බඳවාගෙන වසර 03 ක් ගතවීමට පෙර * | III ශ්‍රේණිය | ලිඛිත |
| | | II ශ්‍රේණියට උසස් වී වසර 03 ක් ගතවීමට පෙර * | II ශ්‍රේණිය | ලිඛිත |
| | | I ශ්‍රේණියට උසස් වී වසර 05 ක් ගතවීමට පෙර * | I ශ්‍රේණිය | ලිඛිත |
| 03 | MN - 6 | භාෂා පරිවර්තක | | |
| | | II ශ්‍රේණියට පත් වී වසර 03 ක් ගතවීමට පෙර * | II ශ්‍රේණිය | ලිඛිත |
| | | I ශ්‍රේණියට උසස් වී වසර 05 ක් ගතවීමට පෙර * | I ශ්‍රේණිය | ලිඛිත |
| 03 | MN - 6 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | | |
| | | II ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ගතවීමට පෙර * | II ශ්‍රේණිය | ලිඛිත |
| | | I ශ්‍රේණියට උසස් වී වසර 05 ක් ගතවීමට පෙර * | I ශ්‍රේණිය | ලිඛිත |
| 04 | MT - 1 | තොරතුරු හා සන්නිවේදනතාක්ෂණ සහායක | | |
| | | III ශ්‍රේණියට බඳවාගෙන වසර 03 ක් ගතවීමට පෙර * | III ශ්‍රේණිය | ලිඛිත |
| | | II ශ්‍රේණියට උසස් වී වසර 03 ක් ගතවීමට පෙර * | II ශ්‍රේණිය | ලිඛිත |
| | | I ශ්‍රේණියට උසස් වී වසර 05 ක් ගතවීමට පෙර * | I ශ්‍රේණිය | ලිඛිත හා ප්‍රායෝගික |
| 05 | PL - 2 | කළමනාකරණ සංවර්ධන පුහුණු ඒකකයේ අරක්කැමි | | |
| | | III ශ්‍රේණියට බඳවාගෙන වසර 03 ක් ගතවීමට පෙර * | III ශ්‍රේණිය | වාචික |
| | | II ශ්‍රේණියට උසස් වී වසර 03 ක් ගතවීමට පෙර * | II ශ්‍රේණිය | වාචික |
| | | I ශ්‍රේණියට උසස් වී වසර 05 ක් ගතවීමට පෙර * | I ශ්‍රේණිය | වාචික |

* <u>අයදුම්පත් කැඳවීමේ අවසාන දින වන විට</u> **ඉල්ලුම් කරනු ලබන පරීක්ෂණය සඳහා අදාළ ශ්‍රේණියට බඳවා ගෙන හෝ උසස් වී තිබීම <u>අනිවාර්යය වේ</u>.**
**(අදාළ ශ්‍රේණියට පත්වූ / උසස් වූ ලිපියේ ඡායා පිටපතක් <u>අනිවාර්යයෙන්ම</u> අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය. එසේ නොමැති අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.)**

ඇමුණුම - 02

## පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ - 2025(1)

| අනු අංකය | වැටුප් කේතය | තනතුර | ශ්‍රේණිය | පරීක්ෂණය |
|---|---|---|---|---|
| 01 | MN - 4 | අභ්‍යන්තර විගණන හා විමර්ශන නිලධාරී (ක්ෂේත්‍රගත / කාර්යාලගත නිලධාරී ඛණ්ඩ 2 සේවා ගණය) | | |
| | | I ශ්‍රේණියට උසස් වී වසර 05 ක් ගතවීමට පෙර * | I ශ්‍රේණිය | ලිඛිත |
| 02 | | අභ්‍යන්තර විගණන නිලධාරී | | |
| | | III ශ්‍රේණියට බඳවාගෙන වසර 03 ක් ගතවීමට පෙර * | III ශ්‍රේණිය | ලිඛිත |
| | | II ශ්‍රේණියට උසස් වී වසර 03 ක් ගතවීමට පෙර * | II ශ්‍රේණිය | ලිඛිත |

* <u>අයදුම්පත් කැඳවීමේ අවසාන දින වන විට</u> **ඉල්ලුම් කරනු ලබන පරීක්ෂණය සඳහා අදාළ ශ්‍රේණියට බඳවා ගෙන හෝ උසස් වී තිබීම <u>අනිවාර්යය වේ</u>.**
**(අදාළ ශ්‍රේණියට පත්වූ / උසස් වූ ලිපියේ ඡායා පිටපතක් <u>අනිවාර්යයෙන්ම</u> අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය. එසේ නොමැති අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.)**

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
සිංහල - S දෙමළ - T

ආදර්ශ අයදුම්පත්‍රය

**උතුරු මැද පළාතේ.......................................කාර්යාලයේ / දෙපාර්තමේන්තුවේ**

**.................................................................................... තනතුරේ**

**I / II / IIIශ්‍රේණිය සඳහා වනකාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ- 2025 (1)**

* අදාළ නොවන අංකය කපා හරින්න

---

1.0 1.1මුලකුරු සමඟ නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) Mr/ Mrs/ Miss

..........................................................................................................................

(සිංහලෙන් / දෙමළෙන්)මයා / මිය / මෙය

..........................................................................................................................

1.2මුලකුරු වලින් හැඳින්වෙන නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

..........................................................................................................................

(සිංහලෙන් / දෙමළෙන්)

..........................................................................................................................

1.3 ජාතික හැඳුනුම්පත් අංකය : ...........................................................................................

2.0 තනතුර : ........................................................................... ශ්‍රේණිය : ..................................

2.1 මුල් පත්වීම් දිනය :...........................................................................................................

2.2 දැනට දරන ශ්‍රේණියට බඳවාගත් / උසස් වූ දිනය* : ..........................................................

**(අදාළ ශ්‍රේණියට බඳවා ගැනීමේ / උසස් වූ ලිපියේ ඡායා පිටපතක් අනිවාර්යයෙන්ම අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය.)**

2.3 පත්වීම් බලධාරියා : ...........................................................................................................

3.0 අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / ආයතනය : ..............................................................................

3.1සේවා ස්ථානයේ ලිපිනය :(ප්‍රවේශ පත්‍ර මෙම ලිපිනයට එවනු ලැබේ)

..........................................................................................................................................

......................................................................................................................

3.2සේවා ස්ථානයේ දුරකථන අංකය :...........................................................................................

3.3 ජංගම දුරකථන අංකය : ......................................................................................................

4.0 පෙනී සිටීමට අපේක්ෂිත විෂයයන් සහ විෂය අංක : (බඳවා ගැනීමේ පරිපාටියේ අදාළ විෂය නිර්දේශය අනුව)

| **විෂය අංකය** | **විෂයය** |
|---|---|
| | |
| | |
| | |

**5.0** විභාගයට පෙනී සිටින්නේකීවෙනි වතාවට දයන බව : ..............................................................................

**<u>පළමු වතාවට නොවේ නම්</u>** විභාග ගාස්තු ගෙවා ලබා ගත් කුවිතාන්සියේ (NC 100)විස්තර :-

අංකය : ....................................................... දිනය : ...........................................................

ගෙවූ මුදල : .......................................................

නිකුත් කළ දිස්ත්‍රික් / ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ..............................................................

| |
|---|
| (NC 100)**ලදුපතේ ඡායා පිටපතක් ඔබ වෙත තබා ගන්න. මුල් පිටපත මෙහි අලවන්න.** |

**6.0** මින් පෙර විභාගයට පෙනී සිටි වර්ෂයන් හා විභාග අංකයන් (අදාල වේ නම්)<u>අනිවාර්යයෙන් සඳහන් කළ යුතුය</u>,

i. වර්ෂය : ..................................... විභාග අංකය : ................................................

ii. වර්ෂය : ..................................... විභාග අංකය : ................................................

iii. වර්ෂය : ..................................... විභාග අංකය : ................................................

iv. වර්ෂය : ..................................... විභාග අංකය : ................................................

v. වර්ෂය : ..................................... විභාග අංකය : ................................................

vi. වර්ෂය : ..................................... විභාග අංකය : ................................................

**7.0** **<u>අයදුම්කරුගේ සහතිකය :</u>**

ඉහත සඳහන් විස්තර නිවැරදි බවටත්, සඳහන්කර ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මා හට හිමිකම් ඇති බවත්,බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුව සුදුසුකම් ලබා ඇති බවත්, මෙම විභාගය සඳහා පනවා ඇති නීතිරීති පිළිපැදීමට ද එකඟ බවත්, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණ වලට හා විභාගය පැවැත්වීමට අදාළ සියලු විධිවිධානයන්ටමම යටත් වන බවත් මෙයින් ප්‍රකාශ කර සිටිමි.

.................................................

දිනය : ................................................ අයදුම්කරුගේ අත්සන

**8.0** **<u>පෞද්ගලික ලිපිගොනු භාර විෂය නිලධාරියාගේ / නිලධාරිනියගේ සහතිකය :</u>**

මෙම අයදුම්පත භාර ගන්නා අවසාන දිනයට පෙර මා වෙත බාරදුන් බවත්, අදාළ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය පරිදි නිවැරදි බවත්, පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු වලට අනුව ................. ශ්‍රේණියේ සේවය කරනු ලබන අයදුම්කරු විසින් නිවැරදිව මෙම අයදුම්පත සම්පූර්ණ කර ඇති බවත්, මෙම අයදුම්පතේ පිටපතක් පෞද්ගලික ලිපිගොනුවට ගොනු කළ බවත් සහතික කරමි.

..............................................

දිනය : ................................................ විෂය භාර නිලධරයාගේ අත්සන

**9.0** **<u>දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :</u>**

ඉහත නම් සඳහන් ......................................................................................... මයා/මිය/මෙනවිය* මෙම දෙපාර්තමේන්තුවේ / කාර්යාලයේ ..................................................................................................... තනතුරේ I ශ්‍රේණියේ / II ශ්‍රේණියේ / III ශ්‍රේණියේ*සේවය කරන බවත්, ඔහු/ඇය* ඉහතින් සපයා ඇති විස්තර පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බවත්, ඉහත විභාගයට පෙනී සිටීමට ඉඩදීම සුදුසු බවත් නිර්දේශ කරමි.

.............................................

ආයතන /දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

(නිල මුද්‍රාව තබන්න)

දිනය : ……………………………..

* අදාළ නොවන වචන කපා හරින්න.